# පුරාවිද්‍යා පුවත්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පුවත් හසුන

Archaeological Society of Sri Lanka

15 වෙළුම
3 කලාපය
2019
සැප්තැම්බර්-දෙසැම්බර්


## දකුණු පළාත් අධ්‍යයන චාරිකාව 2019.06.22

දකුණු පළාතේ පිහිටි වැදගත් පුරාවිද්‍යා ස්ථාන නැරඹීම සඳහා 2019 ජුනි මස 22 වන සෙනසුරාදා එක් දින අධ්‍යයන චාරිකාවක් ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය විසින් ඉතා සාර්ථකව සංවිධානය කරන ලද අතර එමගින් අත්දැකීම් සම්භාරයක් එකතු කර ගැනීමට හැකි විය.

**අධ්‍යයනය කරන ලද ස්ථාන**

- මුල්කිරිගල රජමහා විහාරය
- කසාගල රජමහා විහාරය
- නයිගල රජමහා විහාරය
- කටුවන බලකොටුව

මුල්කිරිගල රජමහා විහාරයේ දී මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතා විසින් **පුරාවිද්‍යාත්මක නිර්මාණවලින් හෙළිවන බුද්ධ අනන්‍යතාවය** මැයින් ශාස්ත්‍රීය දේශනයක් පැවැත්වීය.

- මෙම චාරිකාව සඳහා සහභාගී වූ සියලුම සාමාජිකයින්ට හා එම චාරිකාව සංවිධානය කළ ගරු සම්බන්ධීකරණ ලේකම් සංජීවනී විද්‍යාරත්න මහත්මියට බෙහෙවින්ම ස්තුති වන්ත වෙමු.

## 3 වන පර්යේෂණ සම්මන්ත්‍රණය 2019

### ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය

### 2019 නොවැම්බර් මස කොළඹදී

සම්මන්ත්‍රණය සඳහා ලැබී තිබෙන පර්යේෂණ පත්‍රිකා සාරාංශ අතරින් සුදුසු පත්‍රිකා තෝරාගැනීම සඳහා සමාලෝචනය කිරීම දැන් සිදුකෙරේ. තෝරාගත් පත්‍රිකාවල කතුවරුන්ට ඒ පිළිබඳව ඉදිරියේදී දැනුම් දෙන අතර, සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකාව ලබා දීම හා ලියාපදිංචිය 2019 ඔක්තෝබර් 31 දිනට පෙර සිදු කළ යුතුය.

සම්පූර්ණ පත්‍රිකාව එවිය යුතු ලිපිනය - asslconf@gmail.com (විද්‍යුත් තැපැල් මගින් පමණි.)

ලියාපදිංචි වීමේ ගාස්තු - පත්‍රිකා ඉදිරිපත් කරන්නන් රු. 1200/=
- සහභාගි වන්නන් සඳහා රු. 1000/=

- වැඩි විස්තර සඳහා ප්‍රධාන ලේකම් මුදිත කරුණාමුනි මහතා අමතන්න - දුරකථනය - 071-2287497

## සංගමයේ කටයුතු සඳහා දායක වීමට අවස්ථාවක්

පුරාවිද්‍යා සංගමයේ කටයුතු සඳහා සම්පත්දායකත්වයෙන්, පහසුකම් සැපයීමෙන්, සංවිධාන කටයුතුවලින් සම්බන්ධ වීමට කැමැති සාමාජිකයන් පහත සඳහන් යොමුවෙහි ඇති ආකෘති පත්‍රය පුරවන මෙන් ඉල්ලා සිටිමු.

www.tiny.cc/gtm2bz

## මාසික වැඩසටහන්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ මාසික වැඩසටහන් මාලාව යටතේ ඉදිරි මාස 4 තුළ පැවැත්වීමට නියමිත වැඩසටහන් මෙසේය.

- **සැප්තැම්බර් 08 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව: මෙරට පිහිටි 19වන සියවසේ මුල් දශකයට අයත් බ්‍රිතාන්‍ය ඉදිකිරීම් කිහිපයක් පිළිබඳ විමසුමක්

  දේශක: ධනේෂ් විසුම්පෙරුම (නිදහස් පර්යේෂක හා ලේඛක)

- **ඔක්තෝබර් 06 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව: බ්‍රිතාන්‍ය කෞතුකාගාර සතු ආසියානු උරුමය

  දේශක: සංජීවනී විද්‍යාරත්න (අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී, කොළඹ ජාතික කෞතුකාගාරය)

- **නොවැම්බර් 03 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව: පුරාණ ශ්‍රී ලංකාවේ වාරිකර්මාන්තයේ විකාශනය පුරාවිද්‍යාත්මක ඇසින්

  දේශක: පුරාවිද්‍යාව පිළිබඳ මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි (පීඨාධිපති, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, රජරට විශ්ව විද්‍යාලය)

- **දෙසැම්බර් 08 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව: පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි ආරක්ෂා කිරීම සඳහා ආවරණ ඉදිකිරීම

  දේශක: ප්‍රසන්න බී. රත්නායක (අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශාස්ත්‍රීය), පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)

✓ **ඔක්තෝබර් හා නොවැම්බර් මාසවල සංගමයේ දේශන පැවැත්වෙනුයේ මාසයේ පළමුවන ඉරිදා දින බව කරුණාවෙන් සලකන්න.**

ඉහත දේශන කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 96 දරණ තැන පිහිටි රාජකීය ආසියාතික සමිතියේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. (මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ලේ පළමු මහලේ)

- දේශන පැවැත්වෙන දිනවල ප.ව. 1.00ට සංගමයේ විධායක සභා රැස්වීම පැවැත්වේ. ඒ සඳහා ගරු විධායක සභිකයින්ගේ පැමිණීම අපේක්ෂා කරමු.

### ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ලිපිනය හා දුරකථන අංක


ලිපිනය - සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

විද්‍යුත් තැපැල - archaeology.org.lk@gmail.com
වෙබ් අඩවිය - www.archaeology.org.lk

- ගරු සභාපති
  මහින්ද පී. මලලසේකර 072-3322411
- ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති
  ආචාර්ය කාවන් රත්නතුංග 071-7072020
- ගරු උප සභාපති
  නීතිඥ ජිමී මාරඹේ 071-1190727
- ගරු ප්‍රධාන ලේකම්
  මුදිත කරුණාමුනි 071-2287497
- ගරු සහකාර ලේකම්
  යොහාන් පෙරෙයිරා 077-9651201
- ගරු සම්බන්ධීකරණ ලේකම්
  සංජීවනී විද්‍යාරත්න 071-5872591
- ගරු භාණ්ඩාගාරික
  ලක්ෂ්මන් රත්නායක 077-7985543
- ගරු සංස්කාරක
  රුක්ෂිලා වෙත්තමුණි 071-2097055


### නිවේදන

- සාමාජික අයදුම්පත් සංගමයේ වෙබ් අඩවියෙන් PDF ලේඛනයක් ලෙස බාගත කළ (download) හැකිය.
- අපගේ ඊ-පුවත් කණ්ඩායමේ ඊමේල් පණිවුඩ නොලැබේද? එසේ නම් ඔබේ නම, ලිපිනය හා සාමාජික අංකය සඳහන් කළ SMS පණිවුඩයක් ගරු සහාකාර ලේකම් යොහාන් පෙරෙයිරා වෙත 077-9651201 අංකයට යොමු කරන්න.


පුරාවිදූ පුවත් සංස්කරණය
රුක්ෂිලා වෙත්තමුණි
ගරු සංස්කාරක
rukshilawettamuni@gmail.com


# සංගමයේ නිවේදන

## සංගමයේ අරමුදල වෙනුවෙන් මූල්‍යමය පරිත්‍යාග

පුරාවිද්‍යා සංගමය ස්වේච්ඡා සංවිධානයක් වන බැවින් එහි පැවැත්ම උදෙසා ඔබට හැකි අයුරින් මුදලින් පරිත්‍යාග කළ හැකිය. ඔබගේ පරිත්‍යාග මත සංගමයේ කටයුතු විධිමත් ලෙස සංවිධානය කිරීමට අපට හැකි බව කාරුණිකව දන්වමි.

ඔබේ පරිත්‍යාග සංගමයේ රැස්වීම්වලදී මුදලින් ලබාදිය හැකිය.

බැංකුගත කරන්නේ නම් පහත දැක්වෙන සංගමයේ ජංගම ගිණුමට බැරකර බැංකු ආකෘතිපත්‍රය ඔබගේ නම සඳහන් කර අපගේ archaeology.org.lk@gmail.com ලිපිනයට ඊමේල් කිරීමට හෝ පැමිණ ලබාදීමට හැකිය.

ගිණුම් අංකය - **014-1-001-1-0112875**

ගිණුමේ නම - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
Archaeological Society of Sri Lanka

බැංකුව - මහජන බැංකුව, යූනියන් පෙදෙස ශාඛාව
(Peoples Bank, Union Place Branch)

## අලෙවිය සඳහා ඇති සංගමයේ ප්‍රකාශන

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය 1966-2016: පණස් වසරක ඉතිහාසය -
මිල රු. 300 (සාමාන්‍ය මිල රු. 350)

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා
- වෙළුම 7 (2017) - රු. 200 (සාමාන්‍ය මිල රු. 250)
- වෙළුම 6 (2016) - රු. 200 (සාමාන්‍ය මිල රු. 250)
- වෙළුම 3 (2008) - රු. 120 (සාමාන්‍ය මිල රු. 170)
- වෙළුම 2 (2006) - රු. 120 (සාමාන්‍ය මිල රු. 150)

වෙනත්
- සංගමයේ ස්වර්ණජයන්ති සමරු මුද්දර කවරය - රු. 50
- සංගමයේ ස්වර්ණජයන්ති සමරු මුද්දරය - රු. 15

**පුරාවිදූ පුවත්** - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකත්වය වෙනුවෙන් පළකෙරෙන පුවත් හසුනයි.


**ආපසු:**
සංජීවනී විද්‍යාරත්න
සම්බන්ධීකරණ ලේකම් - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.